www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාව: ජවිපෙ නායකයා පුද්ගලීකරනයට සහයෝගය පල කරයි

**Sri Lanka: JVP leader expresses support for privatisation**

**සමන් ගුනදාස විසිනි.**
**2016 අගෝස්තු 27**

මේ මාසයේදී පැවැත් වූ "ශ්‍රී ලංකා ආර්ථික සමුලුව 2016" දී, ජනතා විමුක්ති පෙරමුනේ (ජවිපෙ) නායක අනුර කුමාර දිසානායක, පාඩු ලබන රාජ්‍ය ආයතනවල නය බරට ආන්ඩුව කර නොගසනතාක් දුරට, ඒවා විකුනා දැමීම සඳහා තම පක්ෂයේ සහයෝගය ප්‍රකාශයට පත් කලේය.

ලංකා වානිජ මංඩලය විසින් සංවිධානය කරන ලද ඉහල පෙලේ රාජ්‍ය නායකයන් විසින් අමතනු ලැබූ මෙම මහා ව්‍යාපාරික සමූහය ඉදිරියේ කල දිසානායකගේ ප්‍රකාශය නිශ්චිත වැදගත්කමක් උසුලයි. 1960 හා 70 දශකවලදී මාඕවාදී හා කැස්ත්‍රෝවාදී "සන්නද්ධ අරගලයේ" ප්‍රබල නියෝජිතයින් වූ ජවිපෙ, දැන් කොලඹ දේශපාලන සංස්ථාපිතයට සම්පූර්නයෙන්ම අනුගත වී තිබේ.

ශ්‍රී ලන්කන් ගුවන් සේවය පුද්ගලීකරනය කිරීම ගැමියෙකුට නම් වැදගැම්මකට ඇති දෙයක් නොවනු ඇතැයි ඔහු ව්‍යාපාරික සභාවට පැවසීය. ඔහු තව දුරටත් කියා සිටියේ තමන් වත්මන් මොඩලයට පමනක් විරුද්ධ වන බවයි. "මිනිස්සු නය බරට කර ගසන්නේ නම්, එය පුද්ගලීකරනය කිරීමේ අවශ්‍යතාවය කුමක්ද?" ඔහු ඇසුවේය.

ගිය අප්‍රේල් මාසයේදී ඇප දීමේ නයක් අනුමත කිරීමේ කොන්දේසියක් ලෙස රාජ්‍ය ආයතන පුද්ගලීකරනය කිරීමේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (ජාමූඅ) නියෝග සමග මෙම සඳහන හොඳින් ගැලපේ. ගිය වසරේ දල දේශීය නිෂ්පාදිතයෙන් සියයට 7.5 ක් වූ අයවැය හිඟය 2020 දී සියයට 3.5 කට පහත දැමීම සඳහා ජාමූඅ විසින් නිර්දේශ කරන ලද වැඩ පිලිවෙලෙහි, මෙම විකුනා දැමීම් ප්‍රධාන අංගයකි.

රජය දැනටමත් විකිනීම සඳහා ආයතන ගනනාවක් පෙල ගස්වා ඇත. ශ්‍රී ලන්කන් ගුවන් සේවය විකිනීම සඳහා දැන්වීම් පල කර ඇති ආන්ඩුව සාර්ථක ගැනුම්කරුවෙකු ආකර්ෂනය කර ගැනීමට එහි රැකියා කප්පාදු කරමින් සිටී. පුද්ගලීකරනයට නියමිත අනෙකුත් රාජ්‍ය ආයතන වලට හිල්ටන් හෝටලය, ග්‍රෑන්ඩ් හයත් හෝටලය හා ලංකා හොස්පිටල්ස් යන ආයතන ඇතුලත්ය.

දිසානායකගේ සඳහනේ පැහැදිලි අරමුන වන්නේ ජවිපෙ යනු ව්‍යාපාර-ගැති පක්ෂයක් බව සභාවට සහතික වීමයි. "පුද්ගලික අංශය අප සමග සෘජුවම සම්බන්ධවීම අපේ අවශ්‍යතාවයයි." ඔහු පැවසීය.

තම ජනප්‍රිය මවාපෑම් පසෙක තබා, පස් අවුරුදු බදු විරාම හා රාජ්‍ය හා හවුල් ව්‍යාපාර වැනි පොරොන්දු සමග, ගිය වසරේ පාර්ලිමේන්තු මැතිවරනයට ඉදිරිපත් කල ජවිපෙ මැතිවරන ප්‍රකාශනය මහා ව්‍යාපාර ඉලක්ක කොට ගත්තකි. මැතිවරන ප්‍රචාරය තුලදී පැවැත් වූ විශේෂ රැස්වීමකදී තමන් "ව්‍යාපාරික ප්‍රජාව සමග අත්වැල් බැඳ ගන්නට සූදානම්" බවට ජවිපෙ පොරොන්දු විය.

ගිය වසරේ ජනවාරියේ පැවැත් වූ ජනාධිපතිවරනයෙන් මහින්ද රාජපක්ෂ පරදා ජයග්‍රහනය ලැබීමෙන් පසු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන විසින් ස්ථාපිත කරනු ලැබූ ජාතික විධායක සභාවේ (ජාවිස) ජවිපෙ ද හවුල් කරුවෙකි. ජවිස යනු ආන්ඩුවට උපදෙස් දෙන ඉහල පෙලේ උපදේශක මංඩලයක් වූ අතර ආන්ඩුවේ ව්‍යාපාර-ගැති ප්‍රතිපත්ති සම්බන්ධයෙන් එය වගකීම දැරීය.

එක්සත් ජනපදයේ අනුබලය යටතේ රාජපක්ෂ ඉවත් කොට සිරිසේන බලයට ගෙන ඒමේ තන්ත්‍ර

මාරු මෙහෙයුමට ජවිපෙ සිය පිටුබලය සැපයීය. රාජපක්ෂ ඉවත්කිරීමට වොෂින්ටනය අනුබල දුන්නේ ඔහුගේ ප්‍රජාතන්ත්‍ර විරෝධී වැඩ පිළිවෙල පිලිබඳ උත්සුකයකින් නොව ඔහු චීනය සමග ගොඩ නගා ගත් කිට්ටු සම්බන්ධතා නිසාය.

රාජ්‍ය ආයතන විකුනන හොඳම ක්‍රමය ගැන උපදෙස් දීමට දිසානායකගේ කථාව ප්‍රධාන ලෙසම යොමුවිය. අතීතයේදී විදුලි සංදේශ දෙපාර්තමේන්තුව සාර්ථකව පුද්ගලීකරනය කරන ලද අතර, "අනෙකුත් සියලු පුද්ගලීකරන වැඩසටහන් අපේක්ෂිත ප්‍රතිපල ලබා නොදුන් නිසා, ජනතාව අතර පුද්ගලීකරනයට සාධාරන වූ බියක් ඇති කරමින් අසාර්ථක වුන" බව ඔහු අවධාරනය කලේය.

"අපේක්ෂිත ප්‍රතිපල" යන්නෙන් ඔහු අදහස් කලේ කුමක්දැයි ජවිපෙ නායකයා විස්තර නොකලේය. සත්‍ය ලෙසටම, පුද්ගලික ආයෝජකයන් රාජ්‍ය ආයතන මිලදී ගන්නේ, රැකියා අහිමිකිරීම්, ශ්‍රම බලකායේ වැටුප් හා සේවා කොන්දේසි කප්පාදු කිරීම් හා පාරිභෝගිකයන් සඳහා ඉහල මිල ගනන් හරහා ඔවුනට සුරක්ෂිත ලාභ ලැබේ නම් පමනි.

ජවිපෙ ශ්‍රී ලන්කන් ගුවන් සේවාව විකුනා දැමීමට තම නිහඬ සහයෝගය දෙන අතරේ, එහි සේවකයෝ පුද්ගලීකරනයට එරෙහිව විරෝධතා දක්වමින් සිටිති.

ආන්ඩුවේ අරමුදල්වල හිඟකමින් හා ඉහල නිලධරයේ දූෂන හේතුවෙන් රාජ්‍ය ආයතන බොහෝදුරට තම භූමිකාව, අඩු මිලට සේවා සපයන්නන් බවට පත් කර ඇත. ලංකා විදුලිබල මංඩලය (ලංවිම), ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මංඩලය (ජාජසජම) සහ ලංකා ඛනිජතෙල් සංස්ථාව (ලංඛස) විසින් දරන පාඩු මකාගැනීම සඳහා විදුලි, ජල හා ඛනිජතෙල් මිල ගනන් තව දුරටත් වැඩි කරන ලෙස ජාමූඅ නියෝග කරයි.

"ප්‍රධාන වශයෙන්ම මහජන අවශ්‍යතාවයන් සපයන රාජ්‍ය ආයතනයන්හි තම පංගුව ගැන ආන්ඩුව දැඩි අවධානය යොමු කල යුතු" බවට දිසානායක ප්‍රකාශ කලේය. එහෙත් ආන්ඩුව සතුව පංගුවක් තිබූ පමනින් ආන්ඩුව, මිල ඉහල දැමීම් හෝ කම්කරුවන්ගේ බඩට ගසන වියදම් කප්පාදුකිරීම් නතර නොකරනු ඇත.

වැඩෙන සමාජ අසමානතාව හා දුගීභාවයෙන් පැන නගින අන්තරාය ගැන අනතුරු අඟවන අතරේ, පුලුල් ආර්ථික ගැටලු ගැන ජවිපෙ නායකයා ව්‍යාපාර-ගැති ප්‍රතිපත්ති වැලඳ ගත්තේය. "ආන්ඩුව ඉක්මනින්ම දැවැන්ත නය බර, අපනයන අඩුවීම, ආදායම් අසමානතාව, වෙලඳ හිඟය, නිෂ්පාදනයේ අඩුව හා (ආර්ථිකය) දේශපාලනීකරනය වීම සම්බන්ධව යමක් කල යුතුය"යි ඔහු ප්‍රකාශ කලේය.

රට මුහුන පා සිටින ගැටලු නිරාකරනය කරන්නට දිසානායක කුඩා අයවැයක් යෝජනා කලේය. "තත්වය සමනය කිරීමට ආන්ඩුව ඉක්මනින්ම කුඩා අයවැයක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කල යුතු අතර වර්තමාන මූල්‍ය තත්වය ගැන ජනතාව දැනුවත් කල යුතුය"යි ඔහු පැවසීය.

ආර්ථික අර්බුදයට පිලියම් ලෙස ඉක්මන් වැඩපිලිවෙලක් සඳහා වන ජවිපෙ නායකයාගේ අයැදීම, දුගීභාවය පිලිබඳ ඔහුගේ උත්සුකයේ වංචනික භාවය හෙලි විය. "ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් සියයට 43 ක් තම දවස ගෙවන්නේ රු. 200 (ඩොලර් 1.50) ත් අඩුවෙන් බව අගමැති පාර්ලිමේන්තුවේදී පැවසුවා. එය මේ රටේ ඊනියා සංවර්ධනය ගැන මොන තරම් බරපතල චෝදනාවක්ද." ඔහු විමසීය.

අයවැය හිඟය කපා හැරීමට, වෙලඳාම ඉහල නැංවීමට හා ආන්ඩුවේ වියදම් කපාහැරීමට ක්‍රියාවට නගා ඇති කප්පාදු වැඩපිලිවෙල, කම්කරු පීඩිත ජනතාව මත අලුතින් බර පැටවීම් පමනක් ඇති කරන අතර එම තත්වය හමුවේ සමාජ අසමානතාව තවත් පුලුල් කෙරෙනු ඇත.

දිසානායකගේ කථාව, මෙරට පාලක පන්තියේ හා අන්තර්ජාතික මූල්‍ය ප්‍රාග්ධනයේ විධාන ක්‍රියාවට නංවන්නට සූදානම් පරිපූර්න ධනපති පක්ෂයක් බවට ජවිපෙ පරිවර්තනය වීම අවධාරනය කරයි.

© www.wsws.org